# 2021/07/28 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව

2021/07/28 දින පෙ.ව. 9.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඩේරආරච්චි චෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 16. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 17. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 18. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 20. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 24. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 1. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 2. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 3. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2021.07.28 දින විශේෂ සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියළු ගරු මන්ත්‍රීතුමන්ලා ඇතුළු මන්ත්‍රීතුමියන්ලාට සුභ දිනයක් ප්‍රාර්තනා කරමින් අද දින විශේෂ සභා රැස්වීමක් පැවැත්වීමට හේතුකාරනා පැහැදිලිකර ඔබතුමන්ලා පිළිගැනීමට මා බලාපොරොත්තු වනවා. සභාපතිට ඇති නීතිමය බලතලමත මෙම විශේෂිත රැස්වීම පැවැත්වීමට හේතු වුනේ .අප ප්‍රාදේශීය සභාවේ අඩු පාඩුවක්ව තිබූ ආදාහනාගාරයක් සහ තවත් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් මෙම එළඹෙන මාසයේ ආරම්භ කිරීමට දැනුම් දී ඇති බැවිනි. ගරු මන්ත්‍රීවරුනි, අප සභාව ස්ථාපිත කරදා පටන් මෙහි සභාපතීත්වයන් දැරූ අභාවප්‍රාප්ත අධිනීතිඥ, යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා, විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා, චන්ද්‍රසහබන්දු මැතිතුමා, අජිත් එඩේරආරච්චි මැතිතුමා සහ අභාවප්‍රාප්ත හේමචන්ද්‍ර විලේගේ මැතිතුමාලාගේ අදහසක්ව තිබූ ආදාහනාගාරයක් ස්ථාපිත කිරීම, ඒ කාල වකවානුවල නොහැකි වූයේ, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට අපහසුතාවත් ඒ කාල වකවානුව තුල ජනතාවගේ තිබූ විරෝධාකල්ප නිසාත් බව ඔබ අප දන්නා කරුණක් බව මතක් කරමි. නැතිව එතුමන්ලාට මේ පිළිබඳව අවශ්‍යතාවය නොතිබුණා නොවුන බව සිහි කරමි. ඒ අනුව, මා සභාපතීත්වයට පත්වූ පසු, මෙම අවශ්‍යතාවය වඩාත් තිව්‍ර වූ නිසා මම මේ පිළිබඳව, අදාළ මැති ඇමතිතුමන්ලාගේ උදව් උපකාර ඇතිව මේ සඳහා මෙතෙක් ප්‍රාදේශීය සභා ඉතිහාසයේ ලබන විශාලතම මූල්‍ය ප්‍රතිපාදනය වූ ලක්ෂ 508 ක ආදාහනාගාරය සහ ලක්ෂ 100 ක තල්ගස්වල වෙළඳසංකීර්ණය සඳහා ලබා ගැනීමට හැකිවුනේ. ඒ ගැන මම පෞද්ගලිකවත් සතුටුවෙමින් එය යථාර්ථයක් කර දීමට අවශ්‍ය ඉදිරි කටයුතු කර දීමට උපදෙස් සහ කරුණු සාකච්ඡා කර ගැනීම සඳහා අද දින මෙම විශේෂ සභා රුැස්වීම කැඳවීමට තීරණය කළේ. තව ද මෙම ව්‍යාපෘති කඩිනමින් සිදු කිරීමටඇති බැවින් ඒ සඳහා ඔබතුමන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වෙමින් සභාවට පැමිණි උප සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රීවරුන් පිළිගනිමින් මාගේ පිළිගැනීමේ කතාව නිම කරමි.

**03.සාකච්ඡා කිරීමට බලාපොරොත්තුවන කරුණු**

**01.** තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදි කිරීම සහ ආදාහනාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ඇති කොන්ත්‍රාත් සමාගම් පිළිබඳ විස්තර දැණුම් දීම හා ඉදිරි කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීම.

-

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

අද මේ විශේෂිත සභා රැස්වීමේදී කතා කරන්න බලාපොරොත්තුවෙන්නේ න්‍යායපත්‍රානුකූල කාරණා පමණයි. ඒ අනුව සඳහන් කල කරුණු යටතේ තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදි කිරීම සහ ආදාහනාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ඇති කොන්ත්‍රාත් සමාගම් පිළිබඳ විස්තර දැණුම් දීම හා ඉදිරි කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීමයි. ඒ අනුව ඔබ අප සාකච්ඡා කරලා මේ කටයුත්ත ඉතා ඉක්මණින් ඉටු කර ගන්න කටයුතු කරමු. හරියටම දින නියමයක් නැහැ. නමුත් ලබන මාසෙ 15 වන දින වගේ තමයි මුල්ගල තියන්න හිතාගෙන ඉන්නෙ. ආදාහනාගාරය ඉදි කරන ස්ථානයේ දැනට පවතින තත්වය නිරීක්ෂණය කරන්න එම ස්ථානයට යමු කියලා මම ඔබතුමන්ලාට ආරාධනා කරනවා. ආදාහනාගාරය සකස් කිරීම සම්බන්ධයෙන් ලක්ෂ 508 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් වෙලා තියෙනවා. ඒක නීත්‍යානුකූල භාවයෙන් පත්තරයෙ දැන්වීමක් මගින් ටෙන්ඩර් ඉදිරිපත් කරලා, ආදාහනාගාරය සැකසීම සඳහා ටෙන්ඩර්කරුවන් 03 දෙනෙක් සහ තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට ටෙන්ඩර්කරුවන් 05 දෙනෙක් ඉල්ලුම්පත් යොමු කර ඇතත්, ආදාහනාගාරය සැකසීම සඳහා ටෙන්ඩර්කරුවන් 02 දෙනෙක් සහ තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ටෙන්ඩර්කරුවන් දෙදෙනෙක් පමණයි ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට සහභාගී වුනේ.

"මෙහිදී 2021.07.05 දින පවත්වන ලද ටෙන්ඩර් කමිටුවෙන් පසු ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන ආයතනය හා සම්බන්ධ තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන ලදී. එම තාක්ෂණ ඇගයීම් කමිටුවේ තීරණය පරිදි තල්ගස්වල නගරයේ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා එස්.එන්.ජේ.කේ. කන්ස්ට්‍රක්ෂන් වෙත අනුමැතිය ලබා දී තිබුණි. ඒ සඳහා ඉදිරිපත් වූ ඒ.එස්.එන්.කන්ස්ට්‍රක්ෂන් වෙතින් ප්‍රමාණවත් තරම් සුදුසුකම් නොවූ නිසා එම ටෙන්ඩර්පත ප්‍රතික්ෂේප වී තිබුණි. (ආසන්න වසර 10 ක කාලය තුල ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා දායක වී නොතිබීම ඊට හේතු වී ඇත.)"

**වෙළඳ සංකීර්ණය**

වෙළඳ සංකීර්ණය සඳහා ඇස්තමේන්තුගත මුදල - රු. 10,000,000.00

ටෙන්ඩර් කමිටුවෙදි ඉදිරිපත් වුන මුදල් (ආයතන සමඟ)

| | | |
|---|---|---|
| A.S.N. Contruction, Gintota | - With Vat | - - |
| | Without Vat | -රු.8,168,133.35 |
| S.N.J.K. Construction , Elpitiya | - With Vat | -රු. 9,184,1.97 |
| | - Without Vat | -රු. 8,503,900.90 |

අනුමත වූ මුදල හා ආයතනය S.N.J.K. Construction , Elpitiya මෙම ආයතනය තාක්ෂණ කමිටු වාර්තාවෙන් නිර්දේශ අනුව අනුමත කර ඇත. සුදුසුකම් හා පලපුරුද්ද අනුව වැඩි ටෙන්ඩරය තාක්ෂණ කමිටුව විසින් තෝරාගෙන ඇත.

අඩු ටෙන්ඩරය ප්‍රතික්ෂේප වීමට හේතු

A.S.N. Contruction, Gintota ආයතනය ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධව පලපුරුද්ද නොමැති වීමත් CIDA ලියාපදිංචිය C 7වීමත් නිසා ප්‍රතික්ෂේප වී ඇත. S.N.J.K. Construction , Elpitiya

ආයතනය ගොඩනැගිලි ඉදිකිරීමේ පලපුරුද්ද හා CIDA ලියාපදිංචිය C 6වීම නිසා මෙම ආයතනය වැඩි ටෙන්ඩරයට වුවද තෝරා ගෙන ඇත.

**තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ඇති කොන්ත්‍රාත් සමාගම් පිළිබඳ යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා, සහ ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධයෙන් 2021.06.30 දින පැවැත්වූ ටෙන්ඩර් කමිටුවෙන් පසුව ඉදිරි කටයුතු සඳහා පළාත් පාලන ආයතනය හා සම්බන්ධ තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන ලදී. එම තාක්ෂණ ඇගයීම් කමිටුවේ තීරණය පරිදි ආදාහනාගාරය ඉදිකිරීම සඳහා එම්.එන්.ජී.කන්ස්ට්‍රක්ෂන්, දෙල්ගොඩ, ගම්පහ වෙත අනුමැතිය ලබා දී තිබුණි.

**ආදාහනාගාරය**

ආදාහනාගාරය සඳහා රජයෙන් අනුමත වූ මුදල - රු. 50,800,000.00

ටෙන්ඩර් කමිටුවෙදි ඉදිරිපත් වුන මුදල් (ආයතන සමඟ)

| | | |
|---|---|---|
| Mng Construction (PVT) Ltd, Delgoda | - With Vat | - රු. 47,444,400.00 |
| | Without Vat | - රු. 43,930,000.00 |
| Ring Engineering (PVT) Ltd | - With Vat | - රු. 48,359,704.72 |
| | Without Vat | -රු. 44,777,509.00 |

තාක්ෂණ කමිටු නිර්දේශය අනුව අඩු මිල ටෙන්ඩරය වූ Mng Construction (PVT) Ltd, Delgoda - With Vat 47,444,400.00 අනුමත කර ඇත.

**ආදාහනාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ඇති කොන්ත්‍රාත් සමාගම් පිළිබඳ යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා, සහ ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රීවරුනි, අද විශේෂ සභා වාරයක් පවත්වලා, විශේෂ තීන්දු තීරණ ගැනීමේදී සියළු දෙනාගේ එකඟතාවය මත එම කටයුතු සම්බන්ධයෙන් අපටද අවස්ථාව ලබා දීම පිළිබඳව මුළින්ම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. ඇත්තෙන්ම ටෙන්ඩර් පටිපාටිය පිළිබඳව මහා සභාව දැනුවත් වෙන්න ඕන. අපේ ටෙන්ඩර් කමිටුවේ අවස්ථා දෙකටම මම සම්බන්ධ වුනා. අපි ටෙන්ඩර් කමිටුවේ සිටින මන්ත්‍රීවරු වශයෙන් මේ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා සමඟ සිදු වුන සිදුවීම් පිළිබඳව සාකච්ඡා කිරීමට, දැන් සභාපතිතුමා මේ සභාවට කරුණු රාශියක් ඉදිරිපත් කළා. නමුත් මෙම ටෙන්ඩර් කමිටුවේ ගත් තීරණ වලට පරිබාහිරව තාක්ෂණ කමිටුව උඩින් ඉන්නවා. තාක්ෂණ කමිටුවේ නිර්දේශය තමයි. ටෙන්ඩර් කමිටුවත් පිළිගන්නෙ. තාක්ෂණ කමිටුවේ නිර්දේශය මේ අවස්ථාවෙදි සභාපතිතුමාට වාචිකව කියලා තියෙනවා. දැන් අපි ගරු මන්ත්‍රීතුමන්ලත් සමග කතා කළා. වාචිකව නෙමෙයි අපිට ලිඛිතව ලැබෙන්න ඕන. නැත්නම් අඩුවෙන් ඉල්ලුවත් අර නිර්නායකය

නැත්නම් ඒක අපට පිලිගන්න වෙනවා. අත්දැකීම් හා පලපුරුද්ද යටතේ යම් කර්මාන්තයක් කරපු කෙනෙක්. ඒ වගේම අලුතින් එන කෙනෙකුට මේක කරන්න බැහැ.

ඒ වගේම ආදාහනාගාරය සකස් කිරීම සම්බන්ධයෙන් තාක්ෂණ කමිටුව විසින් නිර්දේශිත මිළට වඩා ලක්ෂ 9 ක් වැඩිපුර ඉල්ලා සිටි බැවින්, එය අඩුකිරීම සම්බන්ධයෙන් කතා කල විට ටෙන්ඩර්කරු ප්‍රකාශ කලේ (Mng Construction (PVT) Ltd,) අවශ්‍ය බඩු පිටරටකින් ඕඩර් කරන්න අවශ්‍යයි, කොරෝනා ප්‍රශ්නයත් එක්ක ඒවායේ මිළ වැඩි වෙලා කියලා. තව ලක්ෂ 31/2 ක් නම් අඩු කරන්නම් කියලා පසුව අපි බැලුවා වැලිවිටිය දිවිතුර සභාවෙත් ආදාහනාගරය ටෙන්ඩර් එක අරන් තියෙන්නෙ අපගේ ටෙන්ඩර්කරුමයි එහෙත් තාක්ෂණ කමිටුවෙන් ලක්ෂ 19 ක මුදලක් අඩු කරන්න කියලා අපිත් කිව්වා අපිටත් දෙකෙන් පංගුවක් අඩු කරන්න කියලා ඒ විදියට තමයි අපට ලක්ෂ 4 ½ ක් අඩු වුනේ. ඉතුරු ලක්ෂ 4 ½ පියවන විදිය ඔබතුමා ලිඛිතව රාජකාරි මට්ටමින් කර ගන්න ඕන . එහෙම නොවුනොත් මේ මුදල අපිට පියවන්න වේවි. එහෙම වුනොත් අපි මේ කමිටුවෙ හිටපු අය විදියට වැරදිකරුවො වේවි. එතනදි මේ කරුණු විමර්ශනය වෙලා, අධිභාර ගෙවන්නත් සිදු වේවි. අපි මෙතන කතාකරලා පමණක් නැගිටලා යනවා. නමුත් ලේකම්තුමිය ප්‍රමුඛ නිලධාරීන්ට තමයි මෙම වගකීම භාරගන්න වෙන්නෙ. ඒ නිසා ඔබතුමා තීන්දු තීරණ ගැනීමේදී වාචිකව නැතිව ලිඛිතව තීන්දු තීරණ ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේම ආදාහනාගාරයට යන පාර සම්බන්ධයෙන් කිහිප දෙනෙක්ම කතා කළා. මෙම පාර අඩි 20 ක්වත් පුළුල් වෙන්න ඕන කියලා. ඒ සම්බන්ධවත් ඔබතුමා අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මේ සභාවෙ සිටින මන්ත්‍රීවරු විදියට ඔබතුමන්ලා සියළු කාරණා සම්බන්ධව දැනුවත් භාවයක් තියෙන්න ඕන. අවශ්‍ය නම් තවදුරටත් දැනගන්න යමක් තිබේනම්, ගරු සභාපතිතුමාගෙන් විමසලා දැනගන්න කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

**ගරු මන්ත්‍රී**තුමන්ලා, පළමුවෙන්ම කියන්න ඕන. මේක විශේෂ සභා රැස්වීමක්. ඉතා කෙටි කාලයක් තුල ඉතාමත් සුහදශීලී ආකාරයෙන් මේ කටයුතු සිදු වුනා. ඇත්තටම මට අද හරි සතුටුයි. මොකද අපේ බලාපොරොත්තු ටිකිනි ටික ඉටුවෙනවා. මමත් ඕනම දේකට නිර්භයව උත්තර දෙන්නෙ, කතා කරන්නෙ අප සතුව යම් මුදල් ප්‍රමාණයක් තියෙන නිසයි. මේ 27 දෙනාගෙම එකමුතුබව හා වාසනාව නිසා තමයි මේ දේවල් ලැබෙන්නෙ. විශේෂයෙන් යම් යම් තීරණ ගනිද්දී සාමූහිකව තීරණ ගැනීමට අවශ්‍ය නිසා තමයි අද ඔබතුමන්ලා කැඳවීමට හේතුව වුනේ. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම තුල විශාල මූල්‍ය ප්‍රතිපාදනයක් අපට ලැබිලා තියෙනවා. මම සභාපතිධුරය භාරගන්නා විට තිබුනේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක්. මම සභාපතිධුරය භාරගන්නා අවස්ථාවෙදී මගේ ලොකුම බලාපොරොත්තුව තිබුනෙ මේ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධ කටයුත්ත තමයි. ඒ වන විට හිටපු ලේකම්තුමිය ගොඩක් වැඩ කොටසක් මේ සම්බන්ධව යම් වැඩපිළිවෙලක් ගෙන ගොස් තිබුන නිසා මේ ආදාහනාගාර කටයුත්තෙදී අපි ගොඩක් උනන්දු වුණා. එම අවස්ථාවෙදි අපට මේ කටයුත්තෙදි සහය දැක්වූ හිටපු ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමාත්, වජිර අබේවර්ධන ඇමතිතුමාත් විශේෂයෙන් සිහිපත් කරන්න අවශ්‍යයි. අපේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන් පත් වූ විගස මෙය යථාර්ථයක් බවට පත් කරගන්න ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාල මැතිතුමාත්, දිස්ත්‍රික් නායක, ගරු පාර්ලිමේන්තු අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාත් අපට නිරන්තරයෙන් සහයෝගය

දැක්වූවා. එතුමන්ලාගේ උත්සාහයෙන් හා කැපවීමෙන් තමයි මේ සියළු කටයුතු සිදු වුනේ. ඒ අනුව ඔවුන්ගේ මඟපෙන්වීම යටතේ අදාළ ආයතනවල අමාත්‍යාංශ ලේකම්වරුගේ සහයෝගය ඇතුව අපට මේ කටයුත්ත කරගන්න හැකිවුණා. යූ.ජී.ආරියතිලක මැතිතුමා, විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා, නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා, සහබන්දු මැතිතුමා, අජිත් එඩේරආරච්චි මැතිතුමා, හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා, මේ සියළුම හිටපු සභාපතිවරුන් අප බල ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදිකිරීමට උත්සාහ කරලා තිබුනා. මෙම සියළුම සභාපතිවරුන්ගේ සිහිනය අද යථාර්ථයක් බවට පත්වෙලා තියෙනවා. කඩිනමින් හා විනිවිදභාවයකින් යුක්තව තමයි ඒ කටයුත්ත කරන්න ඕන. ඒ සඳහා ඔබ සියළු දෙනාගෙම සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ නිසයි මේ විශේෂ සභාව කැඳෙව්වෙ. සහභාගි වූ සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දින සභාවේ කටයුතු අවසන් කරනු ලබනවා.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-